WWW.OLEVELAPI.COM

OL/2016/50-S-I, II (NEW)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW — ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka — 50 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2016 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2016 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2016

| | |
|---|---|
| නාට්‍ය හා රංග කලාව I, II<br>நாடகமும் அரங்கியலும் I, II<br>Drama and Theatre I, II | පැය තුනයි<br>மூன்று மணித்தியாலம்<br>Three hours |

## නාට්‍ය හා රංග කලාව I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරන්න.

(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස, දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.

● පහත දැක්වෙන පද්‍ය හා ගද්‍ය පාඨ ආශ්‍රයෙන් අංක **1** සිට **4** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) ඇයිද යකුනි තොපි පෙරළි කරන්නේ
කෑකෝ ගසමින් බෙරි හඬ දෙන්නේ
නිසංසලේ අපි මෙතන සිටින්නේ
එහෙව් අපට ඇයි තොපි ඉන්ට නොදෙන්නේ

(ii) නොමද සිතුවිලි සීන බියකරු - බූත වෙස්ගෙන මා පෙළෙයි නිති
මාගේ මව හා නැගණියන් ගැන - සිතේ නිරතුරු ඇත රැඳී බිය

(iii) ගම්බීර තෙදැති කොන්ස්තන්, තීනු පූරේ කොන්ස්තන්, තීනු පූරේ
පූර වර්ධන කරන අග, නරනා මෙමං

(iv) දන්නෝ බුදුන්ගේ ශ්‍රී ධර්මස්කන්දා
ජේවී රකිති සොඳ සීලේ නිබන්දා
ක්ලේශ නස්නා භික්ෂූ ඇත්තේය බෝසේ
රහතුන් නිවසනා පායා ප්‍රකාශේ

**1.** එදිරිවීර සරච්චන්ද්‍රගේ සිංහබාහු නාට්‍යයට අයත් වන්නේ,
(1) i ය. (2) ii ය. (3) iii ය. (4) iv ය.

**2.** නාඩගම් සම්ප්‍රදායට අයත් වන්නේ,
(1) i ය. (2) ii ය. (3) iii ය. (4) iv ය.

**3.** බන්ධුල ජයවර්ධන විසින් රචිත නාට්‍යයක ගී ඛණ්ඩයක් වන්නේ,
(1) i ය. (2) ii ය. (3) iii ය. (4) iv ය.

**4.** නූර්ති සම්ප්‍රදායේ ගීත ඛණ්ඩය වන්නේ,
(1) i ය. (2) ii ය. (3) iii ය. (4) iv ය.

● නිවැරදි පිළිතුර තෝරන්න.

**5.** පහත සඳහන් කලා අතුරෙන් ප්‍රාසංගික කලා ගණයට ගැනෙන්නේ,
(1) සංගීත සන්දර්ශන, නර්තන දර්ශන, මුද්‍රා නාට්‍ය සහ ඔපෙරා ය.
(2) සංගීත සන්දර්ශන, වේදිකා නාට්‍ය, මූර්ති ඇඹීම සහ ගීත නාට්‍ය ය.
(3) මුද්‍රා නාට්‍ය, සාහිත්‍ය ග්‍රන්ථ, වේදිකා නාට්‍ය සහ නර්තන සන්දර්ශන ය.
(4) රූකඩ, බලි ශාන්තිකර්ම, චිත්‍ර ප්‍රදර්ශන සහ චිත්‍රපට ය.

**6.** මුද්‍රා නාට්‍ය, ගීත නාට්‍ය හා බැලේ නාට්‍ය යන කලා මාධ්‍ය තුනට අයත් වන්නේ,
(1) දෙපානෝ, කැළෑමල්, මානස විල ය. (2) කරදිය, දෙපානෝ, හංස විල ය.
(3) නළ දමයන්ති, පීකිං ඔපෙරා, කැළෑමල් ය. (4) සකුන්තලා, බෙරහඬ, නූර්ති ය.

[ දෙවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

7. වේෂභූෂණ නිර්මාණයේ දී සැලකිලිමත්විය යුතු කරුණු වන්නේ,
   (1) ශෛලිය, කාලය, දේශය හා යුගය ය.
   (2) අමුද්‍රව්‍ය පිරිමැස්ම, ආලේපනවල ගුණාත්මකබව හා ශෛලියට අදාළ බව ය.
   (3) විදුලිය ආලෝකය, ප්‍රේක්ෂක ආකර්ෂණය, යුගය හා නිර්මාණශීලි බව ය.
   (4) දේශය, අමුද්‍රව්‍ය, දීප්තිමත් බව හා යුගය ය.

8. නාට්‍ය සංගීතය හා නාට්‍ය ගීත අයත්වන අභිනය පිළිවෙළින්,
   (1) වාචික අභිනය හා ආහාර්ය අභිනයයි.
   (2) සාත්ත්වික අභිනය හා ආංගික අභිනයයි.
   (3) වාචික අභිනය හා සාත්ත්වික අභිනයයි.
   (4) ආහාර්ය අභිනය හා වාචික අභිනයයි.

9. සංගීතය අවම වශයෙන් යොදා ගැනීම හා ඇතැම්විට නොයොදාගැනීම සිදුවන්නේ,
   (1) නාට්‍යධර්මී නාට්‍යවල දී ය.
   (2) ලෝකධර්මී නාට්‍යවල දී ය.
   (3) මුද්‍රා නාට්‍ය හා බැලේවල දී ය.
   (4) ළමා නාට්‍ය හා යොවුන් නාට්‍යවල දී ය.

10. නාට්‍ය පසුතල නිර්මාණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු වන්නේ,
   (1) පසුතලවලින් ප්‍රේක්ෂක ආකර්ෂණය දිනාගැනීමයි.
   (2) නළුකාර්ය පහසු කිරීමයි.
   (3) අලංකරණයක් ලෙස යොදා ගැනීමයි.
   (4) අධික වියදම් නොදැරීම හා කාලයක් පැවතීමයි.

11. කාචයක් සහිත වූ මෙම පහන ලොකු කුඩා වශයෙන් ද තියුණු හා මඳ වශයෙන් ද ආලෝක ලපයක් ලෙසින් ද ආලෝකය නිකුත් කරයි. මෙම පහන හැඳින්වෙන නම කුමක් ද?
   (1) ධාරාලෝක පහන
   (2) අල්ට්‍රා වයලට් පහන
   (3) බැටින් ලාම්පු
   (4) යොමු පහන

12. යම් චරිතයක් ප්‍රේක්ෂකයා හමුවේ මැනවින් නිරූපණය කිරීම පිණිස රූපණ ශිල්පියා,
   (1) රංග අභ්‍යාස හා ක්‍රීඩා මැනවින් පුහුණු කළ යුතු ය.
   (2) මනා කඩවසම් හෝ රූමත් අයකු විය යුතු ය.
   (3) පිටපත අධ්‍යයනය කර චරිතයේ භූමිකා හඳුනාගත යුතු ය.
   (4) පරිකල්පන හැකියාව මත චරිතයේ භූමිකා වෙනස් කළ යුතු ය.

13. නාට්‍ය පෙළක් රචනා කිරීමේ දී,
   (1) චරිත රංග විධාන හා සංවාද නිරවුල් විය යුතු ය.
   (2) මුල මැද අග සහිත ව පිළිවෙළින් රචනා කර තිබිය යුතු ය.
   (3) ගැටුම් අවස්ථාව නාට්‍යපෙළ අවසානයේ දී නිරාකරණය කළ යුතු ය.
   (4) නාට්‍ය ගීත මගින් නාට්‍ය පෙළ ප්‍රබෝධමත් වී තිබිය යුතු ය.

14. ලෝකධර්මී නාට්‍යයක ලක්ෂණයක් සේ සැලැකෙන්නේ,
   (1) යථාර්ථය ඒ වූ ලෙසට ම වේදිකාවේ ඉදිරිපත් කිරීමයි.
   (2) ස්වාභාවික තත්ත්වයට ආසන්න ස්වරූපයෙන් වේදිකාවේ ඉදිරිපත් කිරීමයි.
   (3) අතිශයෝක්තියට නගා රූපණය ඉදිරිපත් කිරීමයි.
   (4) චලන රටා හා වේදිකා අලංකරණය අතිශයෝක්ත වීමයි.

- පහත දැක්වෙන වගුව ඇසුරෙන් අංක **15** සිට **19** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| නාට්‍යයේ නම | රචකයාගේ නම | පරිවර්තනය/අනුවර්තනය | මෙරට නිෂ්පාදක |
|---|---|---|---|
| රුඩන්ස් | ප්ලෝටස් | කඹය | ක |
| රන් ෆෝ යුවර් වයිෆ් | රේ කුනී | ග | බන්දුල විතානගේ |
| ගුඩ්වුමන් ඔෆ් සෙට්සුවාන් | ජ | හිත හොඳ අම්මණ්ඩි | සුගතපාල ද සිල්වා |
| ට | ගාර්ෂියා ලෝර්කා | මූදු පුත්තු | ගුණසේන ගලප්පත්ති |
| ද ග්ලාස් මෙනාජරි | ටෙනසී විලියම්ස් | අහස් මාලිගා | ඩ |

15. ඉහත වගුවේ 'ක' කොටුවට ඇතුළත් විය යුතු මෙරට අධ්‍යක්ෂගේ නම කුමක් ද?
   (1) බන්දුල ජයවර්ධන
   (2) පරාක්‍රම නිරිඇල්ල
   (3) ධම්ම ජාගොඩ
   (4) රංජිත් ධර්මකීර්ති

16. ඉහත වගුවේ 'ග' කොටුවට අයත් විය යුතු නාට්‍යයේ නම කුමක් ද?
   (1) මකරාක්ෂයා
   (2) රෝමය ගිනි ගනී
   (3) සයුරෙන් ආ ළඳ
   (4) බිරිඳ වෙනුවටයි

17. ඉහත වගුවේ 'ජ' කොටුවට ඇතුළත් විය යුතු රචකයාගේ නම කුමක් ද?
   (1) නිකොලායි ගොගොල්
   (2) බර්නාඩ් ෂෝ
   (3) බර්ටෝල්ට් බ්‍රෙෂ්ට්
   (4) ඇලෙක්සැන්ඩර් වැම්පිලෝව්

[ තුන්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

18. ඉහත වගුවේ 'ට' කොටුවට ඇතුළත් විය යුතු නාට්‍යයේ නම කුමක් ද?
(1) දි එල්ඩර් සන් (2) ද ලෝවර් ඩෙප්ත්ස්
(3) ද පබ්ලික් එනිමි (4) යෙර්මා

19. ඉහත වගුවේ 'ඩ' කොටුවට අයත් මෙරට නිෂ්පාදක වන්නේ,
(1) සුගතපාල සුනන්ද මහේන්ද්‍ර ය. (2) හෙන්රි ජයසේන ය.
(3) ජයලත් මනෝරත්න ය. (4) එදිරිවීර සරච්චන්ද්‍ර ය.

20. නළු-නිළියන් වේදිකාවේ අවකාශයෙහි චලන රටා ඇති කරවීම,
(1) අංග රචනයයි. (2) නර්තන රචනයයි.
(3) වේදිකා රචනයයි. (4) රංග රචනයයි.

21. වේදිකා නාට්‍යයකට නාට්‍යෝපකරණ සැලසුම්කරණයේ දී,
(1) බාහිර ලෝකයේ ඇති භාණ්ඩවලට වඩා බොහෝ විශාල විය යුතු ය.
(2) මටසිලුටු හා අඩු වියදමකින් විය යුතු ය.
(3) සැබවින් ම චිත්තාකර්ෂණීය විය යුතු ය.
(4) නාට්‍යයේ ක්‍රියාවලිය හා බැඳී පැවතිය යුතු ය.

22. දේශීය කෝළම් රංගය පිළිබඳව කරන ලද පර්යේෂණයන්ට අනුව එම්. එච්. ගුණතිලක විසින් රචනා කොට නිෂ්පාදනය කරන ලද නාට්‍යය කුමක් ද?
(1) කපුවා කපෝති (2) සක්කාය දිට්ඨි (3) වෙල්ලවැහුං (4) සකලජන

23. විකෘති වේදිකා නාට්‍යයේ තේමාව වන්නේ,
(1) වැඩිහිටියන්ගේ අපේක්ෂාවට අනුගතව බාල පරපුර සතු සිතුම් පැතුම් හා අපේක්ෂාවන් බිලිදීමයි.
(2) නව යොවුන් වියේ පාසල් දරුවාගේ අධ්‍යාපනයේ තීරක බලය දෙමාපියන් සතු විය යුතු බවයි.
(3) පාසල් අධ්‍යාපනයට මෙන් ම පෞද්ගලික අධ්‍යාපනය ලැබීමට ද දරුවන් යොමුවිය යුතු බවයි.
(4) රටට හා ජාතියට ලැදි දරුවකු ගොඩනඟා ගැනීමට දෙමාපියන් අවධාරණය කළ යුතු බවයි.

- පහත දැක්වෙන ඡායාරූප ආශ්‍රයෙන් **24** සිට **27** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.


ක


ග


ජ


ට

24. මෙහි 'ක' ඡායාරූපයෙන් දැක්වෙන නාට්‍යකරු වන්නේ,
(1) රංජිත් ධර්මකීර්ති ය. (2) සුගතපාල ද සිල්වා ය.
(3) ධර්මසිරි බණ්ඩාරනායක ය. (4) පරාක්‍රම නිරිඇල්ල ය.

25. මෙහි 'ග' ඡායාරූපයෙන් දැක්වෙන නාට්‍යකරු වන්නේ,
(1) සුනන්ද මහේන්ද්‍ර ය. (2) එස්. මෞනගුරු ය.
(3) සයිමන් නවගත්තේගම ය. (4) ආර්. ආර්. සමරකෝන් ය.

WWW.OLEVELAPI.COM

26. මෙහි 'ජ' හා 'ට' ඡායාරූපයෙන් දැක්වෙන රූපණ ශිල්පිනීහු දෙදෙනා පිළිවෙළින්,
(1) මැණිකේ අත්තනායක හා චාන්දනී සෙනෙවිරත්න ය.
(2) දීපානි සිල්වා සහ රම්‍යා වනිගසේකර ය.
(3) මාලනී රණසිංහ හා කෞෂල්‍යා ප්‍රනාන්දු ය.
(4) කෞෂල්‍යා ප්‍රනාන්දු සහ මැණිකේ අත්තනායක ය.

27. මරාසාද් වේදිකා නාට්‍ය හා සම්බන්ධ දෙපළ සඳහන් ඡායාරූප වන්නේ,
(1) ක හා ජ ය. (2) ග හා ට ය. (3) ක හා ට ය. (4) ග හා ජ ය.

28. පිලිප්පු සිංඤෝ විසින් රචනා කරන ලද නාට්‍යයක් වන්නේ,
(1) නළ රාජ චරිතය ය. (2) රොමියෝ ජුලියට් ය. (3) පණ්ඩුකාභය ය. (4) ඇහැලේපොළ ය.

29. ටවර්හෝල් රඟහලේ පෙන්වන ලද ප්‍රථම නූර්ති නාට්‍යය වන්නේ,
(1) සිරිසඟබෝ ය. (2) සෙනෙගප්පු ය. (3) සකුන්තලා ය. (4) පණ්ඩුකාභය ය.

[ හතරවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

● පහත දැක්වෙන වගුව ආශ්‍රයෙන් **30** සිට **34** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| ක | ග | ජ | ට |
|---|---|---|---|
| අඹ විදමන | ගුරුගේ මාලාව | යුගාසන බණ | සන්නි යකුම |
| රාම මැරීම | ඌරා යක්කම | දොරකඩ අස්න | සූනියම් යාගය |
| මරා ඉපැද්දීම | ගබඩා කොල්ලය | ආලවක දමනය | රිද්දි යාගය |

**30.** උඩරට ශාන්තිකර්මයට අයත් නාට්‍යමය ලක්ෂණ ඇතුළත් කාණ්ඩය වන්නේ,
(1) 'ක' ය. (2) 'ග' ය. (3) 'ජ' ය. (4) 'ට' ය.

**31.** සබරගමු ප්‍රදේශයේ ප්‍රමුඛ ශාන්තිකර්මයන්ට අයත් නාට්‍යමය ලක්ෂණ අඩංගු කාණ්ඩය වන්නේ,
(1) 'ක' ය. (2) 'ග' ය. (3) 'ජ' ය. (4) 'ට' ය.

**32.** පත්තිනි දෙවියන් පුද ලබන නාට්‍යමය අවස්ථාවන් දැක්වෙන කාණ්ඩය වන්නේ,
(1) 'ක' ය. (2) 'ග' ය. (3) 'ජ' ය. (4) 'ට' ය.

**33.** ශාන්තිකර්ම නොවන පූජාකර්ම සඳහන් වන කාණ්ඩය වන්නේ,
(1) 'ක' ය. (2) 'ග' ය. (3) 'ජ' ය. (4) 'ට' ය.

**34.** ගර්භ සංරක්ෂණය අරමුණු කරගත් චතාවන් දැක්වෙන කාණ්ඩය වන්නේ,
(1) 'ක' ය. (2) 'ග' ය. (3) 'ජ' ය. (4) 'ට' ය.

● අංක **35** සිට **37** තෙක් ප්‍රශ්නවලට **නොගැලපෙන** වරණය තෝරන්න.

**35.** කෝළම් නාටකවල
(1) වෙස් මුහුණු බැඳ නැටීම හා බොහෝ චරිතවලට වෙස් මුහුණු ඇත.
(2) හාස්‍යෝත්පාද පූර්ව රංගයක් ඇතුළත් වේ.
(3) වෙස් මුහුණ කුඩා වන අතර හඬ ප්‍රක්ෂේපණයට පහසු කරයි.
(4) රංග භූමිය, සබය හෝ කරළිය නමින් හැඳින්වේ.

**36.** නූර්ති නාට්‍යවල දී,
(1) එල්පින්ස්ටන් රඟහල භාවිත විය. (2) මුල් ම සිංහල නූර්තිය රොලීනා විය.
(3) ජනප්‍රිය නූර්ති රචකයා වූයේ ජෝන් ද සිල්වා ය. (4) කුස ජාතකය පද්මාවතී ආදි නාට්‍ය චාල්ස් ඩයස්ගේ ය.

**37.** රංග අභ්‍යාසවල නිරත වීමෙන් අත්පත් කරගත හැකි ප්‍රතිලාභය වන්නේ,
(1) ශරීරය නමනීය කර ගත හැකි වීමයි. (2) හඬ තීව්‍ර කරගත හැකි වීමයි.
(3) සබකෝලය දුරුකර ගැනීමට හැකි වීමයි. (4) සිරුර ස්ථූල කරගත හැකි වීමයි.

● අංක **38** සිට **40** තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරන්න.

**38.** රූපණ ශිල්පියා විසින් ප්‍රගුණ කළ යුතු අංග දෙකක් වනුයේ,
(1) මානසික ප්‍රකාශනය හා වාක් ප්‍රකාශනයයි. (2) අභ්‍යන්තර ප්‍රකාශනය හා බාහිර ප්‍රකාශනයයි.
(3) අභ්‍යන්තර ප්‍රකාශනය හා සාත්ත්වික ප්‍රකාශනයයි. (4) බාහිර ප්‍රකාශනය හා කථන ප්‍රකාශනයයි.

WWW.OLEVELAPI.COM

**39.** දෑස් අතර සබඳතාව නොගිලිහී පවත්වාගැනීම මූලික කරගත් රංග අභ්‍යාසය කුමක් ද?
(1) දර්පණ අභ්‍යාසය (2) ශිථිලීකරණ අභ්‍යාසය
(3) වාමාවෘත ව දෑස් කරකැවීමේ අභ්‍යාසය (4) නේත්‍රාංජලී අභ්‍යාසය

**40.** මාර්ශල් මාෂොව් නම් ශිල්පියා වර්තමානයේ ලෝකයේ ප්‍රකට,
(1) අංග රචනා ශිල්පියෙකි. (2) භූමිකා රංගන ශිල්පියෙකි.
(3) අධිවිලම්බ රංගන ශිල්පියෙකි. (4) අභිරූපණ ශිල්පියෙකි.

* *

[ පස්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...